(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **22.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 පෙබරවාරි 19 බදාදා පූ.භා. 9 . 30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **කේ. ඩී. ලාල් කාන්ත මහතා,** කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(මහාචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ. වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **විජිත හේරත් මහතා,** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා,** මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පී. රුවන් සෙනරත් මහතා,** පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **එම්. කේ. එම්. අස්ලම් මහතා**

ගරු **හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**

ගරු **(ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**

ගරු **බී. ආරියවංශ මහතා**

ගරු **(වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**

ගරු **අර්කම් ඉල්යාස් මහතා**

ගරු **එම්. එස්. උදුමාලෙබ්බෙ මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**

ගරු **නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**

ගරු **කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**

ගරු **වසන්ත පුෂ්ප කුමාර මහතා**

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු අනුරාධ ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු කෝසල නුවන් ජයවීර මහතා

ගරු ටී. කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු මොහමඩ් සාලි නලීම් මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු  කිංස් නෙල්සන් මහතා

ගරු  අරුණ පනාගොඩ මහතා

ගරු  නිමල් පලිහේන මහතා

ගරු  අජිත් පී. පෙරේරා මහතා

ගරු  කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු  ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු  නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු  ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු  කන්දසාමි ප්‍රභු මහතා

ගරු  අමිල ප්‍රසාද් මහතා

ගරු  රෝහණ බංඩාර මහතා

ගරු  නන්ද බණ්ඩාර මහතා

ගරු  පද්මසිරි බණ්ඩාර මහතා

ගරු  ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු  රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු  විජේසිරි බස්නායක මහතා

ගරු  ජගත් මනුවර්ණ මහතා

ගරු  එස්. එම්. මරික්කාර් මහතා

ගරු  ඉම්රාන් මහරූෆ් මහතා

ගරු  රුවන් මාපලගම මහතා

ගරු  (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු  ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු  ධනුෂ්ක රංගනාත් මහතා

ගරු  සංජීව රණසිංහ මහතා

ගරු  සුනිල් රත්නසිරි මහතා

ගරු  ආර්. එම්. ගාමිණී රත්නායක මහතා

ගරු  සුරංග රත්නායක මහතා

ගරු  අසෝක සපුමල් රන්වල මහතා

ගරු  තුරෛරාසා රවීකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ආර්. ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ෆස්මින් ෂරීෆ් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

ගරු දිනිඳු සමන් මහතා

ගරු තිළිණ සමරකෝන් මහතා

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා

ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

ගරු චන්දන සූරියආරච්චි මහතා

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී. ඩී. සූරියබණ්ඩාර මහතා

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ගරු රවී කරුණානායක මහතා, ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා, ගරු අජිත් පී. පෙරේරා මහතා, ගරු (ආචාර්ය) වී. එස්. රාධක්‍රිෂ්ණන් මහතා, ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා සහ ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා විසින් 2025 පෙබරවාරි 3 වැනි දින විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් සඳහා පාර්ලිමේන්තු කාරක සභාවල ආසන අසමානුපාතික ලෙස ලබා දීම මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය විනැයි යන කාරණය සම්බන්ධයෙන් කරන ලද ඉල්ලීම්වලට අනුව, පාර්ලිමේන්තුවේ කථානායක වශයෙන් මම අදාළ කාරණය පිළිබඳව අධ්‍යයනයක් සිදු කළ අතර 2025 පෙබරවාරි 5 වැනි දින පොරොන්දු වූ පරිදි මාගේ ස්ථාවරය මෙම ගරු සභාවට අනාවරණය කිරීමට තීරණය කළෙමි.

මම එම විස්තරාත්මක තීරණය පහත දක්වනු කැමැත්තෙමි:

(1) මම මෙම ගරු සභාවේ ආණ්ඩු පාර්ශ්වය මෙන්ම විරුද්ධ පාර්ශ්වය ද නියෝජනය කරන භාරකරු වන බැවින්, පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සිදු කර ගෙන යාමේදී සෑම විටම මාගේ අපක්ෂපාතිත්වය පවත්වා ගනිමි.

(2) කාරක සභා නියෝජනය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් විසින් මතු කරනු ලබන කාරණය පිළිබඳව පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ කිසිදු වගන්තියක පැහැදිලි ලෙස අවධාරණය කරනු ලැබ නොමැති බැවින් එම පනත ප්‍රකාරව, කිසිදු වරප්‍රසාද උල්ලංඝනයක් සිදු වී නොමැත.

(3) පෙර පාර්ලිමේන්තුවල — එනම් 7 වැනි, 8 වැනි හා 9 වැනි පාර්ලිමේන්තුවල — කාරක සභාවන්හි සංයුතිය සලකා බලා ස්ථාවර නියෝගවල කුමක් සඳහන්ව තිබුණද කාරක සභාවල දෙපාර්ශ්වයේම සාමාජික සංඛ්‍යාව වැඩි කිරීමට දෙපාර්ශ්වයම (ආණ්ඩු පාර්ශ්වය හා විරුද්ධ පාර්ශ්වය) එකඟ වී තිබේ.

තවද, 10 වැනි පාර්ලිමේන්තුවේ ඇතැම් කාරක සභාවල, විශේෂයෙන්ම පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සහ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවල, ආසන සංඛ්‍යාව දෙපාර්ශ්වයේම අභිමතය පරිදි වැඩි කර ඇති බව මම නිරීක්ෂණය කළෙමි.

(4) එම්. එන්. කවුල් හා එස්. එල්. ශක්ධර් විසින් රචිත 'පාර්ලිමේන්තු ව්‍යවහාරය හා කාර්ය පටිපාටිය (විශේෂයෙන් ලෝක් සභාව කෙරෙහි අවධානය සහිතව)' නමැති කෘතිය තුළ මෙසේ සඳහන් කර ඇත —

'පාර්ලිමේන්තු කාරක සභාවක් පාර්ලිමේන්තුව විසින් පත් කිරීම හෝ තෝරා පත් කිරීම හෝ කථානායකවරයා විසින් නම් කිරීම කරනු ලැබේ.' එමෙන්ම, එම කෘතිය කාරක සභාවල පත් කිරීම්, ධුර කාල හා කාර්යයන් සහ කාරක සභාවන්හි කටයුතු සිදු කිරීම හා ප්‍රධාන කාර්ය පටිපාටි මාර්ග යන කාරණා කථානායකවරයාගේ තීන්දුවල හා නියෝගයන්හි විධිවිධානයන්ට අනුව නියාමනය කෙරෙන බව ද තවදුරටත් විස්තර කර ඇත. එම නිසා එම කාරක සභා පිහිටුවීමේදී ස්ථාවර නියෝග අනුගමනය කරමින් තීරණ ගැනීමට කථානායකවරයාට සිදු විය.

ඉහත සඳහන් කෘතියේ 775 වැනි පිටුවෙහි කාරක සභා සඳහා සාමාජික මන්ත්‍රීවරයන් පත් කිරීම පාර්ලිමේන්තුව විසින් ඉදිරිපත් කර සම්මත කරන ලද යෝජනා සම්මතයක් මඟින් හෝ කථානායකවරයා විසින් නම් කිරීම මඟින් සිදු කෙරෙන බව වැඩිදුරටත් පැහැදිලි කර දෙයි. එසේ හෙයින්, සිය මධ්‍යස්ථභාවය සහ අපක්ෂපාතීත්වය පවත්වා ගැනීම සඳහා ස්ථාවර නියෝගයන්හි විෂය පථය තුළ ක්‍රියා පටිපාටිය දැඩිව අනුගමනය කිරීම පිළිබඳ ලිඛිත නීති මාලාවකට කථානායකවරයා අනුකූල විය යුතු ය.

එම කෘතියෙහි 776 පිටුව තුළ වැඩිදුරටත් දක්වා ඇත්තේ 'විශේෂිත පාර්ලිමේන්තු කාරක සභාවලට සාමාජික මන්ත්‍රීන් නම් කිරීම සභානායකවරයා සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ පක්ෂවල සහ කණ්ඩායම්වල නායකයින් සමඟ කතිකා කිරීමෙන් අනතුරුව කථානායකවරයා විසින් සිදු කරනු ලැබිය හැකි ය' යනුවෙනි.

එම නිසා, මෙම සභාවේ සෑම පක්ෂයක් සමඟම සාකච්ඡා කිරීමෙන් අනතුරුව සම්මතික තීරණයක් ගැනීම සභාවේ කාර්යයකි.

(5) කාරක සභාවලට සාමාජික මන්ත්‍රීන් නම් කිරීමේදී තේරීම් කාරක සභාව විසින් ඔවුන්ගේ සුදුසුකම් හා සභාවේ සංයුතිය පිළිබඳව සැලකිල්ල යොමු කළ යුතු යැයි අර්ස්කින් මේ විසින් රචිත 'පාර්ලිමේන්තුවේ නීතිය, වරප්‍රසාද, රැස්වීම් හා භාවිතය පිළිබඳ නිබන්ධය' නම් කෘතිය තුළ පැහැදිලිවම දක්වා තිබේ. ඒ අනුව, තේරීම් කාරක සභාව සැමවිටම කාරක සභාවන් තුළ සභාවේ පක්ෂ-දේශපාලනික සංයුතිය පිළිබිඹු කරන බවට වගබලා ගනු ඇත. තවද, කාරක සභාවකට නම් කරනු ලැබිය හැකි සාමාජික මන්ත්‍රී සංඛ්‍යාව පිළිබඳව සීමාවක් නොමැති බව ද එතුළ පොදුවේ පැහැදිලි කර දී තිබේ. කාරක සභාවකට මුලින්ම නම් කරන ලද සාමාජිකයින් නම් කරන ලද පරිද්දෙන්ම පසුව පත් කරනු ලබන සාමාජික මන්ත්‍රීන් ඇතුළත් කිරීමෙන් එම කාරක සභා විශාල කරනු ලැබිය හැකි ය.

එම නිසා, කාරක සභා සම්බන්ධයෙන් මෙකී සංයුතිය සඳහා වූ සමීකරණය සැකසීමේදී, මා හට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයන්හි මූලධර්මයන්ට පටහැනිව කටයුතු කිරීමට හැකියාවක් නොමැත. යම් පාර්ශ්වයකට කාරක සභාවක නිර්දේශිත සාමාජික සංඛ්‍යාව ඉක්මවා යාමට අවශ්‍ය වන්නේ නම්, අදාළ තීරණය එක් එක් පාර්ශ්වකරු සමඟ එකඟත්වයෙන් එය සිදු කළ යුතු වෙයි.

(6) අවසන් වශයෙන්, වෙන් කරනු ලබන කාරක සභා සාමාජික මන්ත්‍රී ආසන සංඛ්‍යාව වැඩි කළ හැක්කේ කෙසේද යන ප්‍රශ්නය පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කරනු පිණිස ආණ්ඩු පාර්ශ්වය හා විරුද්ධ පාර්ශ්වයේ පක්ෂ වශයෙන් එක් වන ලෙස මම ඔබ සැමගෙන් ඉල්ලා සිටිනු කැමැත්තෙමි.

තවද, ඉහත සඳහන් කරන ලද පනතෙහි කිසිදු වගන්තියක් ඒහා සම්බන්ධ බලතල හා වරප්‍රසාද පිළිබඳව පැහැදිලිව සඳහන් කර නොමැති හෙයින්, කිසිදු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ කිසිදු වරප්‍රසාදයක් උල්ලංඝනය වී නොමැතිය යන්න මම ප්‍රකාශ කරමි.

(7) පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය සුරකිනු පිණිස මෙම ගැටලුවෙහි බැරෑරුම්කම පිළිබඳව අවබෝධ කර ගෙන, මෙම කාරණය පිළිබඳව බැරෑරුම් ලෙස සලකා කටයුතු කරන මෙන් මම ඔබ සැමගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය ඉදිරිපත් කර, එම වාර්තාව සහ ගිණුම් ප්‍රකාශනය සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) පරිසර අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පරිසර අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) මාවතගම, අරම්පොවත්ත, අංක 143 දරන ස්ථානයෙහි පදිංචි ඩී. එම්. ආර්. රාජසිංහ මහතාගෙන් ලැබුණු 2024.12.07 දිනැති පෙත්සම;

(ii) මාවතගම, වැලිකඹුර, අංක 09 දරන ස්ථානයෙහි පදිංචි එම්. පී. ගුණරත්න මහතාගෙන් ලැබුණු 2024.12.19 දිනැති පෙත්සම;

(iii) වැඋඩ, පරගහදෙණිය, නුවර පාර, අංක 56 දරන ස්ථානයෙහි පදිංචි එම්. ආර්. එස්. රහ්මාන් මහතාගෙන් ලැබුණු 2024.12.28 දිනැති පෙත්සම; සහ

(iv) දොඩම්ගස්ලන්ද, මීපිටිය, ගොන්ගහවත්ත යන ලිපිනයෙහි පදිංචි ආර්. එම්. අනුලාවතී මහත්මියගෙන් ලැබුණු 2025.01.10 දිනැති පෙත්සම

ගරු ජේ. සී. අලවතුවල මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) සායින්දමරුදු - 14, ජලසම්පාදන පාර, අංක 541ඒ /1 දරන ස්ථානයෙහි පදිංචි ඒ. එල්. එම්. මුක්තාර් මහතාගෙන් ලැබුණු 2024.12.03 දිනැති පෙත්සම; සහ

(ii) ගලගෙදර, කන්දෙකුඹුර, අංක 268, සේන ප්‍රභාත් යන ලිපිනයෙහි පදිංචි එම්. ඒ. විමලසේන මහතාගෙන් ලැබුණු 2024.12.03 දිනැති පෙත්සම

ගරු ඉම්රාන් මහරූෆ් මහතා විසින් පිළිගන්වන ලදී.

(3) කොටදෙණියාව, පොල්වත්ත යන ලිපිනයෙහි පදිංචි කේ. ඒ. රංජනී කුසුමලතා මහත්මියගෙන් ලැබුණු 2024.12.01 දිනැති පෙත්සම ගරු අමිල ප්‍රසාද් මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) දෙවනගල, රුවන්දෙනිය, අංක ඩී -78 දරන ස්ථානයෙහි පදිංචි ජේ. එම්. එස්. ඩී. එස්. බණ්ඩාර මහතාගෙන් ලැබුණු 2024.12.02 දිනැති පෙත්සම; සහ

(ii) හිඟුල, උඩමාකඩවර, ඇටඹලන්ද යන ලිපිනයෙහි පදිංචි කේ. එම්. දසනායක මහතාගෙන් ලැබුණු 2024.11.18 දිනැති පෙත්සම

ගරු නන්ද බණ්ඩාර මහතා විසින් පිළිගන්වන ලදී.

(5) යටියන්තොට, වී ඔය, කොටුවේ ගෙදර යන ලිපිනයෙහි පදිංචි එම්. විල්මට් පෙරේරා මහතාගෙන් ලැබුණු 2024.12.16 දිනැති පෙත්සම ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා විසින් පිළිගන්වන ලදී.

(6) මාතලේ, වාරියපොළ පාර, අංක 23/13 දරන ස්ථානයෙහි පදිංචි ඒ. සුන්දරලිංගම් මහතාගෙන් ලැබුණු 2024.12.11 දිනැති පෙත්සම ගරු දීප්ති වාසලගේ මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(7) (i) නිට්ටඹුව, වේබඩගල්ල, කුරුඳුවත්ත, අංක 66/04 දරන ස්ථානයෙහි පදිංචි එච්. පී. ඩබ්ලිව්. ජයසේකර මහතාගෙන් ලැබුණු 2024.11.26 දිනැති පෙත්සම;

(ii) ගම්පහ, මුදුන්ගොඩ, අංක 329/ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්. කේ. මාලා ධර්මසිරි මහත්මියගෙන් ලැබුණු 2024.12.05 දිනැති පෙත්සම;

(iii) පල්ලේවෙල, පනාවල්ලන්ද, අංක 46/2 දරන ස්ථානයෙහි පදිංචි ආර්. එස්. එස්. එච්. එම්. එච්. ධර්මපාල හේරත් මහතාගෙන් ලැබුණු 2024.11.26 දිනැති පෙත්සම;

(iv) මීගමුව, දකුණු කදිරාන, ජයබිම, අංක 27/1 දරන ස්ථානයෙහි පදිංචි එස්. ඒ. සෝලිත සුබසිංහ මහතාගෙන් ලැබුණු 2024.11.29 දිනැති පෙත්සම;

(v) එල්ලක්කල, වලලියද්ද, අංක 80/7 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. ඒ. ඩී. පුෂ්පකුමාර මහතාගෙන් ලැබුණු 2024.12.03 දිනැති පෙත්සම; සහ

(vi) පල්ලේවෙල, බෝරුක්ගමුව, අංක 64 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. ඒ. කේ. අජිත් වික්‍රමසිංහ මහතාගෙන් ලැබුණු 2024.12.01 දිනැති පෙත්සම

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. විසර්ජන පනත් කෙටුම්පත — (දෙවැනි වෙන් කළ දිනය):** කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය (2025 පෙබරවාරි 17),—

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යි ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

(පූ.භා. 11.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 2.30 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

"ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.12 ට ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන්, විවාදය කල් ගියේ ය; එතැන් සිට විවාදය 2025 පෙබරවාරි 20 බ්‍රහස්පතින්දා පවත්වනු ලැබේ.

**5. කල් තැබීම:** එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2025 පෙබරවාරි 06 සභා සම්මතිය අනුව, 2025 පෙබරවාරි 20 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.